www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ මැතිවරන උද්ඝෝෂනයට උපහාරයක්

## A tribute to the SEP election campaign in Sri Lanka

**2009 පෙබරවාර 19**

සමාජවාදී සමානතා පක්ෂය (සසප) පලාත් සභා මැතිවරනයේදී සිවිල් යුද්ධය, රාජ්‍ය මර්දනය හා වර්ගවාදයේ වාතාවරනයක් තුල ගෙනයනු ලැබූ දිරිමත් හා සප්‍රතිපත්තික දේශපාලන උද්ඝෝෂනයට ලෝක සමාජවාදී වෙබ් අඩවිය සිය උපහාරය පුද කරයි. එය වනාහි සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා අරගලය පිලිබඳ දිරිගන්වන සුලු නිදසුනක් මෙන් ම විවිධ වර්ගයේ ජාතික, වාර්ගික, භාෂාමය හා ගෝත්‍රික බෙදීම්වලින් ඉරිතලා ගිය ලෝකයක් තුල එවන් ක්‍රියාමාර්ගයක් සඳහා සටන් කල නොහැකි බවට දිව්රා සිටින සියල්ලන් එකහෙලා ප්‍රතික්ෂේප කර දැමීමක් ද විය.

ප්‍රමුඛතම ප්‍රශ්නය වූයේ බෙදුම්වාදී දෙමල ඊලාම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි ආන්ඩුවේ යුද්ධයයි. 25 වසරක ගැටුම, 70,000කට වැඩි ජීවිත සංඛ්‍යාවක් බිලි ගෙන ඇති අතර, උතුරු හා නැගෙනහිර බොහෝ කොටසකට විනාශය ගෙන දී ඇතුවා පමනක් නොව, ජනජීවිතයේ සෑම අස්සක් මුල්ලකටම එහි ප්‍රතිවිපාක විහිද ගොස් ද තිබේ. නිරන්තරයෙන්ම ඇඟ කිලිපොලායන ආකාරයකට සිහි ගන්වන්නේ, දිවයින පුරා සන්නද්ධ හමුදා භටයන් විසින් පවත්වාගෙන යන මුර කපොලු හා විශේෂයෙන්ම දෙමල ජනතාව අත්තනෝමතික ලෙස රඳවා තැබීමේ තර්ජනයයි. එක් හෝ තවත් ආකාරයකින් කරවටක් වාර්ගික දේශපාලනයේ ගිලී සිටිමින් ක්‍රියාශීලී ලෙස යුද්ධයට සහායෝගය දක්වන ප්‍රධාන ප්‍රවාහයේ පක්ෂ හා මාධ්‍ය, දේශපාලන ජීවිතය තුල අධිකාරය දරති.

යුද්ධයට විරුද්ධව, උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම හා කොන්දේසි විරහිතව හමුදා ඉවත්කර ගත යුතු බව කියා සිටි එකම පක්ෂය සසප පමනි. එහි අපේක්ෂකයෝ, තමන් නියැලී සිටින්නේ ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක ය'' යන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ප්‍රකාශයට එක එල්ලේ අභියෝග කලහ. යුද්ධයේ මූලයන් පවතින්නේ බලයට පත් සෑම කොලඹ ආන්ඩුවක් ම දශක ගනනාවක් තිස්සේ ගෙන ගිය දෙමල විරෝධී වෙනස්කම් කිරීම තුල යයි, සසප පෙන්වා දුන්නේය. ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය සඳහා සටන් කිරීම කෙසේ වෙතත්, ආන්ඩුව යුද්ධය ගෙන යන්නේ, සිංහල බෞද්ධ රාජ්‍යයක් පවත්වා ගැනීම මගින් සිංහල ප්‍රභූ පැලැන්තියේ අධිකාරය සුරක්ෂිත කර ගැනීම සඳහා ය.

ඒ සමගම සසප, එල්ටීටීඊයට හා එහි දෙමල බෙදුම්වාදයට කිසිදු දේශපාලන සහයෝගයක් නොදුන්නේය. එල්ටීටීඊය, සාමාන්‍ය වැඩකරන ජනතාවගේ අවශ්‍යතා කිසිවිටෙකත් නියෝජනය නොකල අතර, දෙමල ධනේශ්වරයේ කොටස් වෙනුවෙන් පෙනී සිටියහ. එය ආරම්භයේ සිටම මහජනතාවගේ එකමුතුව සඳහා වන දේශපාලන අරගලය ප්‍රතික්ෂේප කරමින්, ඒ වෙනුවට ඉල්ලුම් කලේ කිසිදු තර්කාන්විත ආර්ථික ශක්‍යතාවකින් තොරවූ වෙනම දෙමල රාජ්‍ය කැබැල්ලකි. එල්ටීටීඊයේ ''සන්නද්ධ අරගලය'' වන්දනාමාන කිරීම සමග අත්වැල් බැඳගෙන, දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කිරීම හා එහි ඉවක් බවක් නැති සිංහල සිවිල් වැසියන් ඝාතනය, කෙලින්ම සේවය කලේ කොලඹ සිංහල ස්වෝත්තමවාදීන්ගේ අත ශක්තිමත් කිරීමටය.

සසප, කම්කරු පන්තිය එක්සත් කිරීමටත් ශ්‍රී ලංකා ධනේශ්වරයේ සියලු කොටස්වලින් එහි දේශපාලන ස්වාධීනත්වය තහවුරු කිරීමටත් දේශපාලන ක්‍රියාමාර්ගයක් වර්ධනය කලේය. යුද්ධය හා වාර්ගික දේශපාලනය සෑම විටම එල්ලකරනු ලැබුවේ කම්කරු පන්තිය බෙදීමට හා ධනේශ්වර රාජ්‍යයට මුක්කු ගැසීමට බව සසප අපේක්ෂකයෝ පෙන්වා දුන්හ. යුද්ධය සමග අත්වැල් බැඳගෙන නිදහස් වෙලඳපොල ප්‍රතිසංස්කරන, වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන්ට නොනැවතී පහර එල්ලකර තිබේ. යුද්ධය හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාර නිමා කිරීමටත්, ධනවතුන් හා දුප්පතුන් අතර පුලුල් වන ආගාධයට අවසන් තිත තැබීමටත් හැකි එකම මාවත වන්නේ සමාජවාදී දේශපාලනය මත පදනම් වූ කම්කරු-ගොවි ආන්ඩුවක් සඳහා අරගලයයි. ඒ දකුනු ආසියානු සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ගොඩනගන ශ්‍රී ලංකා-ඊලාම් සමාජවාදී සමූහාන්ඩුවකි.

ශ්‍රී ලංකාව තුල සමාජවාදී ජාත්‍යන්තරවාදය සඳහා අරගලය, සෑමවිටම අසාමාන්‍ය පරිමාවක දේශපාලන හා සැබවින්ම කායික නිර්භීතකමක් ඉල්ලා තිබේ. 1968 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) ලෙස එය ආරම්භ කල තැන් පටන් පක්ෂය සෑම පැත්තකින්ම

ප්‍රහාරයට ලක්ව තිබේ. එහි සාමාජිකයන් සය දෙනෙක් එක්කෝ රාජ්‍ය යාන්ත්‍රනය නැතිනම් සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) තුවක්කුකරුවන් විසින් මරාදමනු ලැබ තිබේ. සෑම පක්ෂ සාමාජිකයෙකුම ඔහුට හෝ ඇයට දරාගත නොහැකි තරමේ තර්ජනයන්ට, කායික ප්‍රචන්ඩත්වයට හා වධ හිංසාවලට මුහුනපා ඇත. ඉන් දෙකක් ගැන පමනක් සඳහන් කලහොත්, *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ ශ්‍රී ලංකා සාමාජිකයන් අතුරෙන් සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්, 1987 දී විප්ලවවාදී දේශපාලනය වෙනුවෙන් පෙනී සිටීමේ ''අපරාධය'' මත දින 51ක් සිර ගතකොට සිටි අතර කේ. රත්නායකගේ නිවස, යුද්ධයේ ආරම්භය සලකුනු කල 1983 දෙමල විරෝධී කැරලි මධ්‍යයේ, ආන්ඩු-ගැති මැරයන් විසින් ගිනිතබා බිමට සමතලා කරනු ලැබුනි.

පසුගිය සති අන්තයේ මැතිවරනය පවත්වනු ලැබුවේ බියගැන්වීම්, දේශපාලන අඩන්තේට්ටම් හා රාජ්‍ය මර්දනයේ වලාවක් යටතේය. රාජපක්ෂ හා ඔහුගේ ඇමතිවරු ආන්ඩුව විවේචනය කරන්නන්, වැඩ වර්ජක කම්කරුවන් හා විරෝධතාවයේ යෙදුනු සිසුන් ''කොටි ත්‍රස්තවාදීන්'' ගේ ආධාරකරුවන් ලෙස නිරන්තරයෙන් හංවඩු ගැසූහ. මෙය නිකම්ම හිස් තර්ජනයක් නොවේ. ආරක්ෂක හමුදාවන් සමග එක්ව කටයුතු කරන ඝාතක කල්ලි විසින් සිය ගනනක් මිනිසුන් මරා දමනු ලැබ ඇත. 2006 අගෝස්තුවේ දී සසප ආධාරකරුවෙකුවූ සිවප්‍රගාසම් මරියදාස් ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ මුල්ලිපොතන ගමේ දී වෙඩිතබා ඝාතනය කෙරුනි. 2007 මාර්තුවේ දී සසප සාමාජික නඩරාජා විමලේස්වරන් හා ඔහුගේ මිත්‍රයා වූ සිවනාදන් මදිවදනන් උතුරේ කයිට්ස් දිවයිනෙහි නාවික හමුදා මුරපොලක දී ''අතුරුදහන්'' විය. සසප අධිෂ්ඨානශීලී උද්ඝෝෂනයක් ගෙනගිය තතු යටතේ පවා, ආන්ඩුව හා මිලිටරිය සිද්ධිය පිලිබඳ මුලුමනින් ම නිහඬව සිටි අතර එම දෙදෙනා ගැන කිසිදු තොරතුරක් ලබාදීම ප්‍රතික්ෂේප කලහ.

එවන් දේශපාලන වාතාවරනයක් තුල, පහසු මාවත ගනිමින්, පවතින තත්වයට අනුගතව, ජාතික ධනේශ්වරයේ පක්ෂවල කක්ෂයේ තැනක් සොයාගැනීම සඳහා නිරන්තර පීඩනයක් එල්ල වේ. ශ්‍රී ලංකාව නව සමසමාජ පක්ෂය වැනි මධ්‍යම පන්තික රැඩිකල් කන්ඩායම් පිලිබඳව නමක් දරා සිටියි. එහි සමස්ත වාර්තාවම කැපවී ඇත්තේ, එක් හෝ තවත් ප්‍රධාන පක්ෂයක් පිලිබඳව මිත්‍යාවන් ගොඩනැගීම සඳහා ය. ඒ සියල්ල ප්‍රෝඩාවන් බව හෙලිදරව් වී තිබේ. විකොස පිහිටුවනු ලැබුවේ කෙලින්ම එවන් සංකල්පවලට විරුද්ධව ය. ඒවා සිය උච්චතම රූපය ගත්තේ ලංකා සමසමාජ පක්ෂය (ලසසප) 1964 දී සිරිමා බන්ඩාරනායක මහත්මියගේ ධනේශ්වර ආන්ඩුවට ඇතුලු වී විවෘතවම ට්‍රොට්ස්කිවාදී මූලධර්ම අතහරිමින් සිදු කල පාවාදීමත් සමග ය.

සසප ක්‍රියාමාර්ගය පදනම්ව ඇත්තේ ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවයේ න්‍යාය මත ය. එය, කල්පසු වූ ධනේශ්වර වර්ධනයක් සහිත ලංකාව වැනි රටවල ධනපති පන්තිය කිසිදු ප්‍රගතිශීලී ක්‍රියාකලාපයක් ඉටුකිරීමට ඓන්ද්‍රීයවම අපොහොසත් බව කියා සිටියි. ගම්බද ජනතාවන් තමන් වටා පෙලගස්වා ගැනීම මගින් කම්කරු පන්තිය ම පමනක්, ලෝක සමාජවාදී විප්ලවයේ අවියෝජනීය කොටසක් ලෙස, රැඩිකල් කෘෂිකාර්මික ප්‍රතිසංස්කරන ද ඇතුලත් නොවිසඳුනු ප්‍රජාතන්ත්‍රීය කර්තව්‍යයන් ඉටු කරන, සමාජයේ සමාජවාදී පරිවර්තනයක් ආරම්භ කිරීමට සමත් වේ. එම ඉදිරිදර්ශනය 1917 රුසියානු විප්ලවය තුල දී සාධනීය ලෙස ද ආසියාවේ, අප්‍රිකාවේ, මැදපෙරදිග හා ලතින් ඇමරිකාවේ දී සියක් වාරයක් නිෂේධනීය ලෙස ද සනාථ විය. විසිවන සියවස පුරාවට විවිධාකාර ස්ටැලින්වාදී හා අවස්ථාවාදී පක්ෂ ඒ හෝ මේ ධනපති නායකයාගේ හෝ පක්ෂයේ ඊනියා ප්‍රගතිශීලී ගුනාංග උත්කර්ෂයට නැංවූ අතර එය තුඩු දුන්නේ 1925=27 චීන විප්ලවයේ ඛේදනීය පරාජයෙන් ආරම්භව, කම්කරු පන්තියට එකකින් පසු තවෙකක් වශයෙන් පරාජයන් අත්කර දීමට පමනි.

ගෝලීය ධනවාදයේ ප්‍රගාඪ අර්බුදයෙන් විප්ලවවාදී දේශපාලනය තුල නව ආශක්තයන් ජනනය කෙරෙන තතු හමුවේ, විද්‍යාත්මකව පදනම් කල ඉදිරිදර්ශනයක් සඳහා සසප හි අඛන්ඩ අරගලය, තරුනයන්ගේ හා කම්කරුවන්ගේ අත්දැකීම් සමග එකිනෙක ඡේදනය වීම ආරම්භ වෙමින් තිබේ. ශ්‍රී ලංකාවේ නිල දේශපාලන ව්‍යාපාරය තුල යුදවාදය හා භේදකාරී වාර්ගික දේශපාලනය අරක්ගත් තතු හමුවේ, මෙතෙක් බලයට පත්වූ කොලඹ ආන්ඩු විසින් නිර්මානය කරනු ලැබ ඇති විනාශයට විකල්පයක් සොයන කොටස් අතර, සසප ක්‍රියාමාර්ගය ආකර්ශනයක් දිනාගෙන තිබේ. දශක ගනනාවක වර්ගවාදී උසිගැන්වීම් තිබිය දී ද සිංහල, දෙමල හා මුස්ලිම් වැඩකරන ජනතාවගේ ඉමහත් බහුතරය පන්ති සහයෝගිතාවයේ මූලික ඉවකින් යුක්තව හා යුද්ධයට විරුද්ධව සිටිති. ආන්ඩුවට ඡන්දය දුන් අය අතර පවා බොහොමයක් දෙනා එසේ කලේ එල්ටීටීඊයේ පරාජයෙන් වාර්ගික ගැටුම නිමාකර සිය ජීවිතවලට යම් ප්‍රගතියක් ගෙනඑනු ඇතැයි යන ව්‍යාජ බලාපොරොත්තුව මත ය.

කෙසේ වුව ද සසප උද්ඝෝෂනයේ දේශපාලන වැදගත්කම, ශ්‍රී ලංකාවෙන් බොහෝ ඔබ්බට ගමන්කරයි. දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක් පිලිබඳ එහි ඉදිරිදර්ශනය, ඊනියා තුන්වන ලෝකය පුරා කම්කරුවන්ට හා තරුනයන්ට ක්ෂනික අදාලත්වයක් දරා සිටියි. දකුනු ආසියාවේ බොහෝ ගැටුම්වල මූලයන් උප මහාද්වීපය බෙදා වෙන්කල 1947=48 සම්මුතීන් තුලින් සොයා ගත හැක්කේ යම් සේ ද එමෙන්ම, ලෝකයේ අනෙකුත් කොටස් ද විනාශයට පත් කල වාර්ගික, ජාතික හා ගෝත්‍රික ආතතීන්ගේ හා යුද්ධවල

මූලයන් ද පැරනි විජිත අධිරාජ්‍යයන් නිමාවකට පත් කල පශ්චාත් දෙවන ලෝක සංග්‍රාම වැඩපිළිවෙල තුල රැඳී පවතී.

මේ සෑම ප්‍රශ්නයක දී ම ස්වදේශික පාලන ප්‍රභූ තන්ත්‍රයන් වෙත ''නිදහස'' ප්‍රදානය කරනු ලැබුවේ ඔවුන්ගේ හිටපු විජිත ස්වාමීන්ගේ ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ගේ ආරක්ෂාව සහතික කිරීමේ පොරොන්දුව සඳහා හිලව්වක් ලෙස ය. අප්‍රිකානු මහාද්වීපයේ විජිතකරන කැබලි කිරීම මගින් පිහිටුවන ලද ජාතික දේශසීමාවන් පිලිබඳ අත්තනෝමතික පැලැස්තර හෝ, ඔටෝමන් අධිරාජ්‍යය බිඳ වැටීමෙන් පසුව මැද පෙරදිග අටවන ලද දේශ සීමාවන්, සර්ෂන හා ගැටුම්වල නිරන්තර මූලාශ්‍රය බවට පත්ව තිබේ. රටක් රටක් පාසා ධනේශ්වර නියෝජිතයෝ මෙම දේශ සීමාවන් පිලිගනිමින් තමන්ගේම පාලනයන්ට පදනම දමාගැනීම සඳහා නිර්ලජ්ජිත ලෙස ගෝත්‍රික, භාෂාමය හා වාර්ගික විරසකයන් සිය වාසියට හරවා ගත්හ.

සීතල යුද්ධ අවධියේ දී මෙම විවිධ ප්‍රභූ කොටස්වලට අධිරාජ්‍යවාදය හා සෝවියට් කඳවුර අතර උපාමාරු දැමීමට හැකි විය. තමන්ගේම අවස්ථාවාදී අරමුනු වෙනුවෙන් සෝවියට් හා චීන ස්ටැලින්වාදීන් දුන් පිටුබලය සහිතව, ඉන්දුනීසියාවේ සුකර්නෝ, ඊජිප්තුවේ ගමාල් අබ්දුල් නසාර් හා ටැන්සානියාවේ ජූලියස් නියරේරේ වැනි නායකයෝ අධිරාජ්‍යවාදී විරෝධී හා සමාජවාදී පාට තවරා ගත්හ. කෙසේ වුව ද ඔවුන්ගේ උපාමාරු දැමීම්, නිරතුරුව ම නිමාව දුටුවේ විනාශයකිනි. සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසුව ධනේශ්වර ජාතිකවාදයේ විවිධාකාර හුයපට සියල්ල ම පිලිබඳ තර්කනය ඉක්මනින්ම හෙලිදරව්වීමට පටන් ගත්තේය. මැද පෙරදිග පීඑල්ඕවේ සිට දකුනු අප්‍රිකාවේ ඒඑන්සී දක්වා වූ ''සන්නද්ධ අරගලය'' හා ජාතික විමුක්තිය'' පිලිබඳ විවිධාකාර අද්වකාත්වරු, එකෙකුට පසු තවෙකෙත් වසයෙන්, අධිරාජ්‍යවාදය සමග සාමයට එලඹ. තම මිලිටරි ඇඳුම් ආයිත්තම් ව්‍යාපාරික කබා සඳහා හුවමාරුකර ගනිමින් ධනේශ්වර වෙලඳපොල වැලඳගත්හ.

හතර වන ජාත්‍යන්තරයේ ධජය යටතේ දිරිමත්ව සටන් වැදුනු එකම පක්ෂය සසප සමනි. ජාත්‍යන්තර සමාජවාදයේ මූලධර්ම සඳහා සටන් වදිමින්, එය, අධිරාජ්‍ය විරෝධී අරගලයේ ඊනියා ප්‍රතිමූර්තීන්ට ශීර්ෂ නමස්කාරය ප්‍රතික්ෂේප කලේය. එහි මැතිවරන උද්ඝෝෂනය, ලෝකයේ අර්ධ සංවර්ධිත කලාපයන්හි ධනේශ්වර පාලනයේ 60 වසරක උරුමය වන, දුගී භාවයේ මඬවගුරෙන් ද ආර්ථික පසුගාමීත්වයෙන් හා භ්‍රාතෘඝාතක ගැටුම්වලින් ද ගොඩඒමේ පැහැදිලි දේශපාලන මාවතක් පෙන්වීම මගින් ශ්‍රී ලංකාවේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තියේ එකමුතුව වෛෂයිකව ශක්තිමත් කර තිබේ.

අප සියලු කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටින්නේ, සසප ක්‍රියාමාර්ගය හා එහි දේශපාලන අරගලය පිලිබඳ දිගු වාර්තාව ප්‍රවේශමෙන් අධ්‍යයනය කරන ලෙසත්, සසප හා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ නව ශාඛාවන් ආසියාව, අප්‍රිකාව, මැද පෙරදිග හා ලතින් ඇමරිකාව පුරා කම්කරු පන්තියේ නව විප්ලවවාදී නායකත්වය සේ ගොඩනැගීමට සම්බන්ධ වන ලෙසත් ය.

**පීටර් සිමන්ඩ්ස්**

.

© www.wsws.org